
පාඨමාලා විස්තර සටහන 2027

ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන



කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්තනය උදෙසා සභාවට සම්පත්

කවර සංකල්පය ඇබිගේල් වික්‍රමනායක
කවර නිර්මාණය අකිල වීරසිංහ

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය

ජාතීන්ගේ සංවර්ධනය උදෙසා සභාවට සම්පත්

පාඨමාලා විස්තර සටහන 2027

ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන

කිතු සමිඳාණන් තුළ සබැඳි ජීවිතය

දේවධර්මීය අධ්‍යාපනය යනු සමූහයක් ලෙස එක්ව දරන ප්‍රයත්නයකි.

අපගේ ස්වාමීන් වහන්සේ උතුම්ම ආඥාව නැවත පැහැදිලි කිරීමේදී, එය දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම සහ අසල්වැසියාට ප්‍රේම කිරීම ලෙස ප්‍රකාශ කළ සේක (මතෙව් 22:36-40). අපගේ දේවධර්මය මගින් අප අදහන දේ පමණක් සැකසෙන්නේ නැත: ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය ලෙස අප එකිනෙකා සමඟ ජීවත් වන ආකාරය ද එයින් හැඩගැසිය යුතුය.

2027 වසර සඳහා වන CTS තේමාව මගින් අපට අභියෝග කරන්නේ අප දෙස පමණක් නොබලා, අන් අය තමන්ට වඩා උතුම් කොට සැලකීමටත්, අන් අයගේ ජීවිත හැඩගස්වන කතන්දර සහ තත්ව පිළිබඳව අවධානය යොමු කිරීමටත් ය.

2027 වසරේදී CTS හි ඉගෙනීමට කැපවන ඔබ දිරිමත් කරන්නේ මෙම ප්‍රශ්න නිරන්තරයෙන් විමසා බලන ලෙසයි: මා ඉගෙන ගන්නා දෙය . . .

- මාගේ අසල්වැසියා සමඟ මා පවත්වන සබඳතා හැඩගස්වන්නේ කෙසේද?
- මාගේ ප්‍රජාව - සභාව, පවුල, මිත්‍රත්වයන්, රැකියා ස්ථානය සහ අනෙකුත් ප්‍රජාවන් තුළ මා සහභාගී වන ආකාරය හැඩගස්වන්නේ කෙසේද?
- දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ ජීවිතය පිළිබඳ මාගේ අවබෝධය ගැඹුරු කරන්නේ කෙසේද?

අපගේ දේවධර්මීය ඉගෙනීම මගින්, දෙවියන් වහන්සේගේ සෙනඟ ලෙස එකිනෙකා සමඟ විශ්වාසවන්තව ජීවත් වීමට වැඩි වැඩියෙන් හැකි වන පිරිසක් බවට අප පත් වේවා!

ආසියාතික දේවධර්ම සංගමයේ තෘතීක අධ්‍යාපන ආයතනයක් ලෙස පිළිගත් (ATA)
ශ්‍රී ලංකා ජාතික ධර්මදනි සන්ධානයේ හා (NCEASL)
ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සාමාජික (NCCSL)

සන්නිවේදන තොරතුරු

ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන් **extensions@cts.lk**

මාතර +94 77 2848513
matara@cts.lk

අනුරාධපුර +94 77 3496852
dilip@cts.lk

සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන
ඊන්ස්ටීන් ප්‍රනාන්දු මහතා einsteen@cts.lk

ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථාන කළමනාකරු
රාජාරාම් හරිහරන් මහතා haran@cts.lk

පීඨාධිපති
දේවගැති රවින් කල්දේරා ravin@cts.lk

+94 11 2890809 | www.cts.lk

පටුන

	පිටු අංකය
පොදු තොරතුරු	4
කාල සටහන්	6 – 11
පාඨමාලා විස්තරය	12 – 16
බහුස්ථානීය පාඨමාලා	17
අන්තර්ජාලය හරහා පැවැත්වෙන පාඨමාලා	18 – 19
කථිකාචාර්යවරුන්ගේ විස්තර	20 – 24
CTS පාඨමාලා විස්තර	25
ළමා සේවා ක්ෂේත්‍රය	26

පොදු තොරතුරු

CTS පාඨමාලා:

- සාමාන්‍යයෙන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවල එක් පාඨමාලාවක් මසකට එක් වතාවක් බැගින් දින 4 ක් පැවැත්වේ.

පාඨමාලා දේශන පැවැත්වීම:

- **පන්ති කාමරය තුළ:** පාඨමාලාව CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානවලදී ඉගැන්වේ.
- **බහුස්ථානීය පාඨමාලාව:** මෙම පාඨමාලාව CTS අධ්‍යයන මධ්‍යස්ථානවල උගන්වන අතර, තාක්ෂණය භාවිතයෙන් විවිධ අධ්‍යයන මධ්‍යස්ථානවල සිසුන්ටද අන්තර්ජාල අධ්‍යයන පන්ති කාමරයක් තුළ සිට සහභාගිවන්නට හැකියාව ලැබේ. පාඨමාලාව සතියකට වරක් පැවැත්වේ.
- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

CTS පාඨමාලා ගාස්තු:

- එක් පාඨමාලාවක් සඳහා රුපියල් 4,000 ක් අය කෙරේ.

** කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා සහනදායී මිලකට සිසුන්ට සැපයීමට හැකිව ඇත්තේ සේවයේ මිතුරන්ගේ නොමසුරු මූල්‍ය පරිත්‍යාගශීලිත්වය නිසා බැව් අපි කෘතඥතා පූර්වකව සිහිපත් කරමු. මෙම සුවිශේෂී සැපයුමේ යහපත් ගබඩාකරුවන් වීම සිසුන්ගෙන් අපේක්ෂා කෙරේ.*

පාඨමාලා සඳහා CTSහි ලියාපදිංචි වන ආකාරය:

සන්නිවේදන තොරතුරු යටතේ ඇති CTS ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයන්හි සිටින කාර්ය මණ්ඩලය අමතා, පාඨමාලාවලට ලියාපදිංචි විය හැකිය.

කාල සටහන්

2027

	අනුරාධපුර	මාතර	මීගමුව
ජනවාරි - පෙබරවාරි	**ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය** ජනවාරි 26-29 දිලිප් ගුණවීර **ශ්‍රී ලංකා සහා ඉතිහාසය** පෙබරවාරි 9-12 මධු මිහිරි ප්‍රනාන්දු	**නමස්කාරය පිළිබඳ දේවවේදය** ජනවාරි 5-8 මහින්ද මුණසිංහ **ශ්‍රී ලංකා සහා ඉතිහාසය** ජනවාරි 18-21 ශානක ප්‍රනාන්දු **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I** පෙබරවාරි 16-19 ශානක ප්‍රනාන්දු	**නායකත්වය** ජනවාරි 18-21 සනත් අතුකෝරාළ **ජාකොබ් පොතට අනුකූල කිතුනු ජීවිතය** පෙබරවාරි 9-12 නාමල් වීරසිංහ
සතිපතා	**අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලාව** **නායකත්වයට මඟ:** **1 සහ 2 තිමෝති** සිකුරාදා ප.ව.6:00-ප.ව.9:00 සති 8 | ආරම්භය: ජනවාරි 8 ලසිත් රාජකරුණා		
	බහුස්ථානීය පාඨමාලාව **බහුත්වවාදී සමාජයක ධර්මදූත සේවය** සිකුරාදා පෙ.ව.9:00-ප.ව.12:00 සති 10 | ආරම්භය: ජනවාරි 8 සුරංග අතුකෝරාළ		

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

	අනුරාධපුර	මාතර	මීගමුව
මාර්තු - අප්‍රේල්	**නමස්කාරය පිළිබඳ දේවවේදය** මාර්තු 2-5 ඊන්ස්ටීන් ප්‍රනාන්දු **පැරණි ගිවිසුම් පසුබිම** අප්‍රේල් 6-9 ලසිත් රාජකරුණා **නව ගිවිසුම් පසුබිම** අප්‍රේල් 27-30 ශානක ප්‍රනාන්දු	**ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම** මාර්තු 2-5 නාමල් වීරසිංහ **දෙවියන් වහන්සේ සහ ලෝකය** මාර්තු 9-12 දිලිප් ගුණවීර **බයිබලීය ආචාරධර්ම** අප්‍රේල් 27-30 සනත් අතුකෝරාළ	**නව ගිවිසුම ගවේෂණය** මාර්තු 16-19 මහින්ද මුණසිංහ **රූත් පොත** අප්‍රේල් 6-9 මධු මිහිරි ප්‍රනාන්දු
සතිපතා	**අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලාව** **බයිබලය අධ්‍යයන ක්‍රම** සිකුරාදා ප.ව.6:00-ප.ව.9:00 සති 8 | ආරම්භය: අප්‍රේල් 2 දිලිප් ගුණවීර		
	බහුස්ථානීය පාඨමාලාව **බහුත්වවාදී සමාජයක ධර්මදූත සේවය** සිකුරාදා | පෙ.ව.9:00-ප.ව.12:00 | සති 10 | ආරම්භය: ජනවාරි 8 සුරංග අතුකෝරාළ		

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

	අනුරාධපුර	මාතර
මැයි - ජූනි	**උත්පත්ති පොත** මැයි 4-7 බෙනිසි සිල්වා	**දේව සේවය සඳහා පෞද්ගලික හා ආත්මික හැඩගැස්ම** මැයි 11-14 නාමල් වීරසිංහ
	නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා ජූනි 1-4 ලසිත් රාජකරුණා	**ප්‍රධාන ආගම්** ජූනි 14-17 මහින්ද මුණසිංහ
සතිපතා	**අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලාව** **ශ්‍රාවකත්වය** සිකුරාදා | ප.ව.6:00-ප.ව.9:30 සති 8 | ආරම්භය: ජූනි 11 චමිලා සුභාෂ් රණසිංහ	
	බහුස්ථානීය පාඨමාලාව **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම** සිකුරාදා | පෙ.ව.9:00-පෙ.ව.11:30 | සති 12 | ආරම්භය: අප්‍රේල් 30 මනෝජ් පීරිස්	

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

	අනුරාධපුර	මාතර
ජූලි - අගෝස්තු	**බයිබලීය සාමසාධනය** ජූලි 20-23 ඊන්ස්ටීන් ප්‍රනාන්දු **අපයෝජනයට ලක්වූ දරුවන් වෙත සේවය** අගෝස්තු 3-6 ක්‍රිස්නි එදිරිසිංහ	**ධර්මදූත සේවයට හැඳින්වීමක්** ජූලි 20-23 සනත් අතුකෝරාළ **මාර්ක් ශුභාරංචිය** අගෝස්තු 3-6 බෙනිසි සිල්වා
සතිපතා	**අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලාව** **ලිංගිකත්වය පිළිබඳ ආචාරධර්ම** සිකුරාදා | ප.ව.6:00-ප.ව.9:30 සති 8 | ආරම්භය: අගෝස්තු 20 සරත් ද සිල්වා	
	බහුස්ථානීය පාඨමාලාව **ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම** සිකුරාදා | පෙ.ව.9:00-පෙ.ව.11:30 | සති 12 | ආරම්භය: අප්‍රේල් 30 මනෝජ් පීරිස්	

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

	අනුරාධපුර	මාතර
සැප්තැම්බර් - ඔක්තෝබර්	**නායකත්වය** සැප්තැම්බර් 7-10 සරත් ද සිල්වා **ජොහන් ශුභාරංචිය** ඔක්තෝබර් 5-8 දිලිප් ගුණවීර	**බයිබලය අධ්‍යයන ක්‍රම** සැප්තැම්බර් 21-24 ඊන්ස්ටීන් ප්‍රනාන්දු **අපයෝජනයට ලක්වූ දරුවන් වෙත සේවය** ඔක්තෝබර් 19-22 ගයත්‍රි ද අල්විස්
සතිපතා	**අන්තර්ජාලය හරහා පවත්වන පාඨමාලාව** **අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත** සිකුරාදා ප.ව.6:00-ප.ව.9:30 සති 8 | ආරම්භය: ඔක්තෝබර් 22 දිලිප් ගුණවීර	
	බහුස්ථානීය පාඨමාලාව **සාකල්‍ය ළමා සංවර්ධනය** සිකුරාදා | පෙ.ව.9:00-පෙ.ව.11:30 | සති 12 | ආරම්භය: සැප්තැම්බර් 10 චමිලා සුභාෂ් රණසිංහ	

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

	අනුරාධපුර	මාතර
නොවැම්බර් - දෙසැම්බර්	**යෞවන යෞවනියන් සඳහා සේවය** නොවැම්බර් 2-5 දුමින්ද වීරසිංහ **ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III** දෙසැම්බර් 7-10 ශානක ප්‍රනාන්දු	**නිරෝගී විවාහයක් සඳහා උපදේශනය** නොවැම්බර් 9-12 ඊන්ස්ටීන් ප්‍රනාන්දු **යෙසායා** දෙසැම්බර් 7-10 ලසිත් රාජකරුණා
සතිපතා	**බහුස්ථානීය පාඨමාලාව** **සාකල්‍ය ළමා සංවර්ධනය** සිකුරාදා | පෙ.ව.9:00-පෙ.ව.11:30 | සති 12 ආරම්භය: සැප්තැම්බර් 10 චමිලා සුභාෂ් රණසිංහ	

නොවැළැක්විය හැකි හේතු මත ප්‍රකාශිත කාල සටහන වෙනස් විය හැකිය. ලියාපදිංචි වීමට පෙර අදාළ ප්‍රාදේශීය අධ්‍යයන කාර්යාලයෙන් විමසන්න.

පාඨමාලා විස්තරය

බයිබලය අධ්‍යයන ක්‍රම සම්මාන: 2

ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලාවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි.

නමස්කාරය පිළිබඳ දේවවේදය සම්මාන: 2

වර්තමාන සභාව අන් කිසිදු නොවූ අයුරින් 'නමස්කාරය' කෙරෙහි උනන්දුවක් පෙන්නුම් කරයි. දෙවියන් වහන්සේට ගෞරවය ගෙනෙන්නාවූ නමස්කාරය පිළිබඳව බයිබලය පවසන්නේ කුමක්ද? පරණ ගිවිසුම පුරා ඇති යාග පූජා සහ ඉශ්‍රායෙලයේ ගීතිකාවන්ගේ සිට නව ගිවිසුමේ සභාවේ නමස්කාරය දක්වා තේමා සොයා, ඇගයීමට ලක්කර, ඒවායේ ප්‍රායෝගික යෙදීම් අවබෝධ කරගැනීම මෙම පාඨමාලාවේදී සිදුවේ.

ශ්‍රී ලංකා සභා ඉතිහාසය සම්මාන: 2

ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි උරුමය හැදෑරීමට අපූරු අවස්ථාවකි. ලංකාව තුළ කිතුනු දහමේ ආරම්භයද පෘතුගීසින්, ලන්දේසීන්, බ්‍රිතාන්‍යයන් හා ඇමෙරිකානු බලපෑම් තුළින් ක්‍රිස්තියානි සභාව හැඩ ගැසී වත්මන් සභාවේ විවිධත්වය ඇතිවූ ආකාරයද ගවේෂණය කෙරේ.

නායකත්වය සම්මාන: 2

බයිබලයෙන් නායකත්වය ඉගෙනීම

නායකත්වය පිළිබඳ විවිධ අදහස්වලින් සමාජය පිරී ඇත. කිතුනුවන් වන අපි බයිබලයට අනුකූල නායකත්ව ප්‍රතිපත්ති ඉගෙන ගන්නේ කෙලෙසද? මෙම පාඨමාලාව ඔබගේ සේවය තුළ, රැකියා ස්ථානය තුළ, නිවස තුළ ඵලදායි ලෙස නායකත්වය දීමට මග පාදනු ඇත.

ශුද්ධ ආත්මයාණන්ගේ පුද්ගලත්වය සහ කාර්යය සම්මාන: 2

පසුගිය සියවස තුළ අන් කවරදෑටත් වඩා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ කථාබහ සහ සාකච්ඡා පිළිබඳ මහත් උනන්දුවක් ඇතිවී ඇත. ඉතිහාසය පුරා ශුද්ධ ආත්මයාණන් පිළිබඳ දේවවේදය ගොඩනැගුණු ආකාරය ද ශුද්ධ ආත්මයාණන් පිළිබඳව බයිබලය පවසන දේ ද ඉගෙන ගැනීමට අවස්ථාවකි. සභාව තුළත් ඇදහිලිවන්තයන්ගේ ජීවිතය තුළත් ශුද්ධ ආත්මයාණන්ගේ සුවිශේෂී වූත් බලවත් වූත් ක්‍රියා පිළිබඳ දැනගැනීමට මහගු අවස්ථාවකි.

ජාකොබ් පොතට අනුකූල කිතුනු ජීවිතය සම්මාන: 2

යේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ සහෝදරයා වූ ජාකොබ් තුමා විසින් ලියන ලද එකම හසුන්පත ක්‍රිස්තියානි ජීවිතයට අත් පොතකි. දුප්පතුන්ට සැලකිය යුත්තේ කෙසේද? සභාව තුළ සාමය ඇති කරලීමට කුමක් කළ යුතුද? අපගේ වචන ගැන සැලකිලිමත් විය යුත්තේ ඇයි? ජාකොබ් පොත අධ්‍යයනයෙන් යහපත් අභිප්‍රායන්ගේ සිට පෞද්ගලික අදහස් කිරීම් දක්වා කිතුනු ජීවිතාකල්පයන් හැඩගස්වයි.

ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය I සම්මාන: 2

ආරම්භයේ සිට ප්‍රතිසංස්කරණය දක්වා

ක්‍රිස්තියානි සභාව ආරම්භයේ පටන් ප්‍රතිසංස්කරණය දක්වා කාලය අතරතුර මිනිසුන්ගෙන්ද සිද්ධීන්ගෙන්ද දේවධර්මයන්ගෙන්ද පෝෂණය වී හැඩ ගැසී පැමිණ ඇත. සභාවේ මුල් වසර 1400 තුළ බිහි වූ ප්‍රාණපරිත්‍යාගිවරු, තපස්වරු, ධර්මදූතයෝ සහ ප්‍රගමන මෙම අධ්‍යයනයේ දී ඔබට මුණගැසෙනු ඇත.

ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම සම්මාන: 2

“ලෝක දැක්ම උපැස් යුවලක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ” (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත.

දෙවියන් වහන්සේ සහ ලෝකය සම්මාන: 2

දෙවියන් වහන්සේගේ ස්වභාවය හා ගුණාංග, මවන ලද ලෝකය, මනුෂ්‍යත්වය හා පාපයට වැටීම, යන මූලික මාතෘකා වෙත අවධානය යොමු වේ. ක්‍රමික දේවධර්මය විෂය මාලාවේ පළමු අදියරයයි. බයිබලීය පදනම මුල් කරගෙන, කිතුනු චින්තන ඉතිහාසයෙන් හා සමකාලීන සංවාදයන්ද ආශ්‍රිතව අධ්‍යයනය කරනු ලැබේ.

නව ගිවිසුම ගවේෂණය සම්මාන: 2

ගිවිසුම් දෙක අතර කාලපරිච්ඡේදය යනු සිත්ගන්නාසුලු පුද්ගලයන්ගෙන් සහ සිදුවීම්වලින් පිරි විශාල කාල පරාසයකි. මෙම පාඨමාලාව මගින් ජේසුස් වහන්සේගේ සහ අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වීමට බලපෑ වැදගත් සිදුවීම් සහ ප්‍රගමන පිළිබඳව අවබෝධයක් ලබා දෙයි. අන්තර්-ගිවිසුම් කාලපරිච්ඡේදයේ පැවති ජුදෙව් ආගමික පසුබිම, එහි වඩාත්ම වැදගත් ප්‍රගමන, ප්‍රධාන සාහිත්‍ය නිර්මාණ සහ පලස්තීනයේ මෙන්ම රෝමානු ලෝකයේ සංස්කෘතිය පිළිබඳව ගවේෂණය කරනු ඇත. මීට අමතරව, සිසුන්ට අලුත් ගිවිසුමේ පොත් පිළිබඳව ද හැඳින්වීමක් ලබා දෙනු ඇත.

පැරණි ගිවිසුම් පසුබිම

සම්මාන: 2

පරණ ගිවිසුමේ පොත්වල සාරවත් හා වර්ණවත් පසුබිම මෙම පාඨමාලාවේදී පැහැදිලි කෙරේ. පුරාණ මැද පෙරදිග තිබූ සංස්කෘතිය, ආගම් හා එහි ඉතිහාසය ගවේෂණය තුළින් පරණ ගිවිසුම නව ආකාරයෙන් සජීවීව ඔබට දැකගත හැකිවනු ඇත.

නව ගිවිසුම් පසුබිම

සම්මාන: 2

ක්‍රිස්තුස් වහන්සේ හා අපොස්තුළුවරුන්ගේ ලෝකය හැඩගැස්වූ සුවිශේෂී සිද්ධි හා ප්‍රගමන පිළිබඳ අන්තර් දෘෂ්ටියක් මෙම පාඨමාලාව තුළින් ලැබේ. අන්තර් ගිවිසුම් යුගයේ ජුදෙව් ආගම, එහි වැදගත් ප්‍රගමනයන්, වැදගත් ලිපි ලේඛන ගැන මෙන්ම පලස්තීනයේ සහ රෝම ලෝකයේ සංස්කෘතිය ගැනද මෙහිදී විමසා බැලේ.

බයිබලීය ආචාරධර්ම

සම්මාන: 2

බයිබලීය ඇදහිල්ල "දැහැමි දිවියක්" පිළිබඳව දැඩි අවධාරණයක් ඇති කරයි. සීනයි ගිවිසුම, දිවැසිවරුන්ගේ ලියවිලි, ප්‍රඥා සාහිත්‍යය, කන්ද උඩ දේශනාව යනාදියෙන් මතුවන ආචාරධර්මවල බලපෑම ද අලූත් ගිවිසුම් සභාවට ඒවා අදළ කර ගන්නා ආකාරයද මෙම පාඨමාලාවෙන් විමර්ශනයට භාජනය කරනු ඇත.

රූත් පොත

සම්මාන: 2

මෙම පාඨමාලාව රූත් පොතේ සවිස්තරාත්මක අධ්‍යයනයක් ලබා දෙයි, එහි සාහිත්‍යමය සුන්දරත්වය, දේවධර්මානුකූල ගැඹුර, සහ ඓතිහාසික සන්දර්භය පිළිබඳ විමර්ශනය කරමින්. ඉශ්රායෙලයේ විනිශ්චයකරුවන්ගේ කාලය පසුබිම් කරගනිමින්, පක්ෂපාතීත්වය, මුදුගැනීම, සහ දිව්‍ය ආරක්ෂාව පිළිබඳ කතාවක් වශයෙන් රූත්ගේ කතාන්දරය සිසුන් විසින් පරීක්ෂා කරනු ඇත. ගිවිසුම්ගත පක්ෂපාතීත්වය, ඥාති සම්බන්ධතාව, සහ දෙවියන් වහන්සේගේ සියල්ලන් ඇතුළත් කරගත් ගැළවීමේ සැලැස්ම පිළිබඳ තේමා සඳහා විශේෂ අවධානයක් යොමු කරනු ලබන අතර, එය රූත්ගේ ස්ථානය දවිත්ගේ සහ අවසානයේ ක්‍රිස්තුන් වහන්සේගේ පෙළපත තුළ අවසන් වේ.

උත්පත්ති පොත

සම්මාන: 2

මූලාරම්භයන් පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකි. උත්පත්ති පොතෙහි සංස්කෘතික සහ ඓතිහාසික පසුබිම තුළ විචාරාත්මක ඉගැන්වීමක් ගෙනේ. විශ්වයේද මිනිසාගේ ද ඉශ්රායෙල් ජනතාවගේද පාපය සහ ගැළවීමේද ආරම්භය ලියා ඇති පොත ලියැවී ඇති පසුබිම එහි සැකැස්ම, තේමාවන් සහ පණිවුඩය විමර්ශනය කෙරේ.

නිරෝගී විවාහයක් සඳහා උපදේශනය

සම්මාන: 2

විවාහකයන් පෙර නොදුටුවිරූ අභියෝගවලට වත්මනේ මුහුණ දෙයි. අවශ්‍ය උපකාර ලබාගත නොහැකිව බොහෝ දෙනා ප්‍රශ්නවලට මැදිවී සිටිති. උපදේශන කුසලතා සහිත සංවේදීවූත්, පරිණතවූත් සේවක සේවිකාවන්ගේ කාලීන අවශ්‍යතාවක් සභාවට ඇත. එම සේවය තුළින් විවාහකයන් සාර්ථක පවුල් ජීවිතයක් කරා සූදානම් කිරීම හා උපදේශනය සඳහා මගපෙන්වන්නකි.

දේව සේවය සඳහා පෞද්ගලික හා ආත්මික හැඩගැස්ම සම්මාන: 2

දේව භක්තියෙන් ජීවත් වීමට හා පලදායි දේව සේවයකට පෞද්ගලික හා ආත්මික වර්ධනය හැඩගැස්වීම අත්‍යවශ්‍යය. සභාව තුළ අද්විතීය සේවයක් කිරීමට සූදානම් වීමේ පියවරක් ලෙස මෙම පාඨමාලාව ශිෂ්‍යයා ස්වයං-පිළිබිඹුවේ ආත්මික ගමනක් රැගෙන යනු ඇත. මෙහි ඉලක්කය පුද්ගලයා තමා ගැනත් දෙවියන්වහන්සේ හා අන්‍යයන් සමග පවතින සම්බන්ධතාවයත් අවබෝධ කරගැනීම වර්ධනය කිරීමය. මෙම වර්ධනය පිළිබඳ අත්දැකීමේ කොටසක් කුඩා කණ්ඩායම් සාකච්ඡා මගින් ඉටුවනු ඇත.

ප්‍රධාන ආගම් සම්මාන: 2

බෞද්ධ ධර්මය, හින්දූ ධර්මය, ඉස්ලාම් ධර්මය

බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි යන ලෝකයේ ප්‍රධාන ආගම් සඳහා ශ්‍රී ලංකාව නිවහනක් වී ඇත. තම අසල්වාසීන්ගේ ඇදහිලි හා පුරුදු ගැන අවබෝධයක් කිතුනුවන්ට ලැබෙන පිණිස ඒවායෙහි ප්‍රධාන චර්යාධර්ම පිළිබඳ අවබෝධයක්ද, එම බහු ආගමික සන්දර්භය තුළ සංහිඳියාව හා අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කරගෙන, එමගින් අපගේ සංස්කෘතියට දී ඇති සුවිශේෂී දායකත්වයන්ද මෙම පාඨමාලාවෙන් හඳුනාගත හැකිය.

බයිබලීය සාමසාධනය සම්මාන: 2

පුද්ගලයින් අතර ගැටුම දෛනික සිද්ධියකි. එලෙසම ජාතික සහ අන්තර්ජාතික ගැටුම් කිතුනුවන්ගේ අවධානය ගනී. මේ සන්දර්භය ඇතුළත යේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට සාමය සඳහා මැදිහත් වන ලෙස පවසන සේක. බයිබලීය සාමසාධනය ගැටුමේ මූලාශ්‍ර සොයා යෑම, ගැටුම තේරුම් ගැනීම, විසඳීමට සුදුසු ප්‍රතිචාර දැක්වීම සහ සමාව දීම යන පිළිවෙලින් සිදුකෙරේ.

ක්‍රිස්තු ශාසනයේ ඉතිහාසය III සම්මාන: 2

20 වන ශතවර්ෂය

විසිවන සියවස ක්‍රිස්තියානි ශාසනයට ඉතා වැදගත්ය. පෙන්තකොස්ත ප්‍රගමනය, සාමයික ප්‍රගමනය, ශීතල යුද්ධය අතර බෙදුණු ලෝකයේ ක්‍රිස්තියානි සභාව, දෙවන වතිකානු සම්මේලනය වැදගත් ප්‍රවණතා වේ. මෙම ප්‍රවණතා හැදෑරීම තුළින් ඔබට වඩා බලපෑමක් ඇති කළ හැකි ගෝලීය කිතුනුවෙකු විය හැකිය.

යෞවන යෞවනියන් සඳහා සේවය සම්මාන: 2

දෙවිඳුන්ගේ ශ්‍රේෂ්ඨ පැවරුම භූගෝලීයව මෙන්ම පාරම්පරිකවද ව්‍යාප්ත වන්නකි. ගෝලීයකරණය හේතුවෙන් තරුණ භඬ හා ජවය, සමාජයේ ස්වභාවය උඩු-යටිකුරු කිරීමට සමත් වුවද දේව රාජ්‍යයේ වැඩ සඳහා එය සභාව මගින් නොසලකා හැරේ. එහෙයින්ම පාඨමාලාවෙන් යොවුන් ගැටලූ, නව යොවුන් අභියෝග සමඟින් අවුරුදු 14 - 21 පසුවන්නන් ශුභාරංචිකරණයෙන් ශ්‍රාවකත්වයට ගොඩනැගීම පිළිබඳව ගවේෂණය කෙරේ.

ධර්මදූත සේවයට හැඳින්වීමක්

සම්මාන: 2

"දූතනය" සෑම කිතුනුවෙකුම අසා ඇති වචනයක් වුවද ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොපවතියි. මෙම පාඨමාලාව ඔබ දූතනයේ විවිධ පැතිකඩ තුළින් ගෙන යන අතර දෙවියන් වහන්සේගේ දූතනයෙහි ඔබටත්, සභාවටත් ඇති සුවිශේෂී කාර්යභාරය විවිධ මං ඔස්සේ අභියෝගාත්මක ලෙස ඉටුකිරීමට ඔබ සූදානම් කරයි.

අපයෝජනයට ලක්වූ දරුවන් වෙත සේවය

සම්මාන: 2

ලංකාවේ දරුවන් පිළිබඳ ඇති අවධානය ඉතාමත් විරළය. පසුගිය කාලයන්හි අනතුරු නිසා දරුවන්ගේ ජීවිත අකාලයේ අහිමිවීම අසන්ට දකින්ට ලැබිණි. ළමා අපයෝජනය යනු ප්‍රබල සමාජ ප්‍රශ්නයකි. රජයේ ඇස්තමේන්තු අනුව දවසකට දරුවෙකු අපයෝජනයට බඳුන්වෙයි. එවැනි දරුවන් හට සේවය කරන්නේ කෙසේදැයි මෙම පාඨමාලාව ගවේෂණය කරයි.

මාර්ක් ශුභාරංචිය

සම්මාන: 2

කෙටිම, තියුණු ශුභාරංචි කථාවෙහි, පාළුකරයේ සිට සොහොන් ගෙය දක්වා වේගයෙන් ගමන් කරන ලේඛකයා - ශුද්ධාත්මයාණන්ගේ මහ පෙන්වීම යටතේ - ජේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයන් ගලීලයේ සිට ජෙරුසලමට, විප්ලවකාරී ගෝලයෙකු වීමේ ගමනක් සඳහා රැගෙන යයි; මරණයේ සිට ජීවනය දක්වා; ඔටුන්න සිට කුරුසිය දක්වා. ඇවිත් බලන්න! ගවේෂණයේ කොටස්කරුවකු වන්න!

ජොහන් ශුභාරංචිය

සම්මාන: 2

ලියොන් මොරිස් මෙසේ පවසයි: "ජොහන් ශුභාරංචිය යනු කුඩා ළමයකුට දිය මත ඇවිදිය හැකි වූත් හස්තියකුට දිය නෑ හැකිවූත් තටාකයකි." මෙම මාහැගි ශුභාරංචි පොත තුළ ජොහන් තුමා යේසුස් වහන්සේගේ ඓතිහාසිකත්වය ද උන් වහන්සේගේ පුළුල් ඉගැන්වීම ද ගෙන හැර දක්වයි. ඉතා වැදගත් ක්‍රිස්තියානි ධර්මනියාම ගවේෂණය කරමින් ශ්‍රාවකත්වය සඳහා විප්ලවීය කැඳවීමක් ජොහන් තුමා ඉදිරිපත් කරයි.

යෙසායා

සම්මාන: 2

අතිශයින් සිත්ගන්නා සුලු පාඨමාලාවක් වන මෙයින් යෙසායා පොතේ ඓතිහාසික පසුබිම, කර්තෘත්වය, තීරණාත්මක සංසිද්ධීන් සහ අන්තර්ගත පණිවිඩය වර්තමානයට අදළ වන පරිදි අධ්‍යයනය කරනු ලැබේ. දෙවියන් වහන්සේ පිළිබඳ, පැමිණෙන්නට තිබෙන මෙසියස් පිළිබඳ අනාගත වාක්‍යය සහ දේව රාජ්‍යයේ පරිසමාප්තිය පිළිබඳ ඉගෙන ගත හැකිය.

නික්මයාමේ සිට ද්විතීය කථාව දක්වා

සම්මාන: 2

පුරාණ ඉශ්රායෙලයේ හැඩගැස්ම සහ ව්‍යවස්ථාව පිළිබඳ කරුණු ආවරණය වන පංච පුස්තකයේ විශාල කොටසක් අධ්‍යයනය කිරීමට මෙම පාඨමාලාවෙන් ඔබට අවස්ථාව ලබා දෙයි. එක් එක් පොතේ ආකෘතිය, එහි පණිවුඩය, ඉශ්රායෙල් සෙනඟට එය අදළ වූයේ කෙසේද සහ එය අදට අදළ කරගන්නේ කෙසේද යන්න මෙහි අන්තර්ගත වේ.

බහුස්ථානීය පාඨමාලා

බහුත්වවාදී සමාජයක ධර්මදූත සේවය

ගැළවීමට එකම මාර්ගය යේසුස් ක්‍රිස්තුස් වහන්සේද? විකල්ප නොසලකා උඩඟු පණිවිඩයක් වෙනත් ආගම්, ලබ්ධීන් හා වෙනත් ජීවන රටා අනුව ජීවත් වන අයට ප්‍රකාශ කළ හැකිද? මෙම පාඨමාලාව ශුභාරංචියේ හදවත වෙතට ඔබ කැඳවාගෙන යන අතර බහුත්වවාදී සමාජයක යේසුස් ක්‍රිස්තුස් වහන්සේ අන් අයට හඳුන්වා දීම ඵලදායී ලෙස කිරීමට ඔබට මග පෙන්වයි.

සති 10 **අනිවාර්ය**

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-ප.ව.12:00

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **සුරංග අතුකෝරාල**

ක්‍රිස්තියානි ලෝකදෘෂ්ටියක් වර්ධනය කිරීම

“ලෝක දැක්ම උපැස් යුවලක් වැනි ය. අපට පෙනෙන දෙය නොව, අප කුමක් තුළින් දකින්නේද යන්න විස්තර කෙරේ” (පෝල් හීබර්ට්). මෙම පාඨමාලාව අපගේ සිතුම් සහ ආකල්ප ඇගයීමට ලක් කිරීමේ වැදගත්කම පහදයි. මේ ලෝකයේ ක්‍රමයට අනුරූප නොවී ඔබගේ සිතිවිලි සහ චින්තනය නිදහස්ව තබා ගැනීමට ඉවහල් වන බලපෑමක් මෙම පාඨමාලාවෙන් ඔබට ලැබෙනු ඇත.

සති 12 **අනිවාර්ය**

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: අප්‍රේල් 30

සම්මාන: 2

කථිකාචාර්ය: **මනෝජ් පීරිස්**

සාකල්‍ය ළමා සංවර්ධනය

දේශයක මෙන්ම සභාවේ ද අනාගත බලාපොරොත්තුව ළමයින් ය. මෑත යුගයේ සාකල්‍ය ළමා සංවර්ධනයට පදනම වී ඇත්තේ බයිබලීය මූලධර්මයන් ය. ළමුන්ගේ වර්ධනීය මූලධර්මයන් වන ශාරීරික, මානසික, චිත්තාවේගීය, සමාජීය සහ අධ්‍යාත්මික යන අංශ පහ ඔස්සේ අධ්‍යයනයේ යෙදේ. කිතුනු කැඳවීම තුළ ළමුන් හැඩගස්වා වර්ධනය කරන්නේ කෙසේදැයි ඉගෙනීමට මං පාදයි.

සති 12 **වෛකල්පික**

දිනය: සිකුරාදා

වේලාව: පෙ.ව.9:00-11:30

ආරම්භය: සැප්තැම්බර් 10

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

අන්තර්ජාලය හරහා පැවැත්වෙන පාඨමාලා

නායකත්වයට මඟ

1 සහ 2 තිමෝති

තිමෝතිගේ භූමිකාව දැරිය හැකි තරුණ නායකයන් සහ වගකීමක් ඇති විශ්වසනීය තරුණයකුගේ අවශ්‍යතාව දුටු පාවුල් අපොස්තුළුතුමා වැනි උපදේශකයන් වත්මන් සභාව තුළ සිටීම අවශ්‍ය වේ. 1 සහ 2 තිමෝති පොත ගැඹුරින් අධ්‍යයනය කිරීම මගින් නායකත්වයේ ඉහළ තැන් ගැනීමටත් පරිණත කිතුනුවන්ට තරුණ නායකයන්ට උපදෙස් දීමටත් අභියෝග කරනු ඇත.

වෛකල්පික

සති 8

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:00

ආරම්භය: ජනවාරි 8

සම්මාන: 2

කථිකාචාර්ය: **ලසිත් රාජකරුණා**

බයිබලය අධ්‍යයන ක්‍රම

ස්වයං-බයිබල් අධ්‍යයනයට මහෝපකාරී පාඨමාලාවකි. මෙම පාඨමාලාව තුළින් අධ්‍යාපනයට අදළ ප්‍රශ්න ඇසීමටත් ජීවිතයට අදළ කර ගැනීමටත් පුරුදු පුහුණු කරනු ඇත. බයිබලය අධ්‍යයනය කරන ක්‍රම හයක් සහ බයිබලය අධ්‍යයනයට ඇවැසි මෙවලම් ගැන උගනුමට මං පාදයි.

අනිවාර්ය

සති 8

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:00

ආරම්භය: අප්‍රේල් 2

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

ශ්‍රාවකත්වය

21 වන සියවසේදී ජේසුස් වහන්සේගේ මාර්ගය අනුගමනය කරනුයේ කෙසේද?

පළමු ශත වර්ෂය තුළ ශ්‍රාවකත්වය යන්නෙන් අදහස් වූයේ කුමක්දැයි ඉගෙන ගෙන එම ඉගැන්වීම් අද සමාජයේ අභියෝග ජයගැනීමට අදළ කරගැනීමට උපකාරී වේ. ව්‍යාපාරික ලෝකය තුළ, දේශපාලනය තුළ, දූත මෙහෙයන් තුළ ඇති ශ්‍රාවකත්වය පිළිබඳ විප්ලවකාරී ආකෘති හැදෑරීමක් ද සිදුවනු ඇත.

වෛකල්පික

සති 8

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:30

ආරම්භය: ජූනි 11

සම්මාන: 2

කථිකාචාර්ය: **චමිලා සුභාෂ් රණසිංහ**

ලිංගිකත්වය පිළිබඳ ආචාරධර්ම

මිනිස් ලිංගිකතාවට අදළ ආචාරධර්මීය ගැටලූ ගණනාවක් බයිබලීය දෘෂ්ටිකෝණයකින් මේ පාඨමාලාව මගින් විමසා බැලේ. එහිදී ලිංගිකත්වය පිළිබඳ බයිබලීය දැක්ම සහ පුම්භිරි බව, ලිංගික අනුගත වීම, ලිංගික සීමා මායිම් ඇතුළු ඊට අදළ මාතෘකා ගණනාවක් ගවේශනය කරනු ඇත්තේ කාම චිත්‍ර හා රචනා කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කිතුනුවන්ට යහපත් ලිංගිකත්වය පිළිබඳ දෘෂ්ටියක් වර්ධනය කරගත හැක්කේ කෙසේද යන්න විමසා බලමින්ය.

අනිවාර්ය

සති 8

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:30

ආරම්භය: අගෝස්තු 20

සම්මාන: 2

කථිකාචාර්ය: **සරත් ද සිල්වා**

අන්තර්ජාලය හරහා පැවැත්වෙන පාඨමාලා

අපෝස්තුලූවරුන්ගේ ක්‍රියා පොත

වෛකල්පික

ලූක් තුමාගේ දෙවන කෘතියෙන් මුල් කිතුනු ප්‍රජාවන්ගේ ආරම්භය දැක්වෙයි. සෑම කිතුනු පරම්පරාවක්ම තම අනන්‍යතාවය, දූතනය සහ සංවිධානය හැඩගස්වා ගැනීමට ක්‍රියා පොතෙන් පරමාදර්ශ ලබා ගැනීමට උත්සාහ ගෙන ඇත. පළමු සියවසේ ඓතිහාසික සන්දර්භය තුළින් ක්‍රියා පොත කියවා ලූක් තුමා ඉදිරිපත් කරන ප්‍රධාන තේමාවන් මෙම පාඨමාලාවෙන් අධ්‍යයනය කෙරේ. ක්‍රියා පොතේ කිතුනු ප්‍රජාව අත්දුටු අධ්‍යාත්මික හා සමාජීය සංවර්තනය, අභියෝග හා දූතන රටාවන් අද සභාවන්ට අදළ කර ගත හැකි ආකාරය පිළිබඳ සාකච්ඡා කෙරේ.

සති 8

දිනය: සිකුරාදා

වේලාව: ප.ව.6:00-9:30

ආරම්භය: ඔක්තෝම්බර් 22

සම්මාන: 2

කථිකාචාර්ය: **දිලිප් ගුණවීර**

කථිකාචාර්යවරුන්ගේ විස්තර



ඊන්ස්ටින් ප්‍රනාන්දු, HND (Counselling), BTh, PgDip (BAPC)

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහකාර සම්බන්ධීකාරක: ප්‍රාදේශීය අධ්‍යයන වැඩසටහන. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයෙන් උපාධිධාරියෙකි. කිතු සෙවණ සේවයේ දේවගැතිවරයෙකු ලෙස ද ගෝලත්ව මධ්‍යස්ථානයේ ගුරුවරයෙක් සහ උප විදුහල්පතිවරයෙක් ලෙස ද කටයුතු කර තිබේ. උපදේශන කටයුතුවලට සම්බන්ධ වී ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උසස් ජාතික උපදේශන ඩිප්ලෝමාව ලබා ගත් අතර පසුව නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ බෞද්ධ ආයුර්වේද මනෝචිකිත්සාව සහ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ගත්තේය.



සනත් අතුකෝරාළ, BSc, BTh, MA (Hons), PhD

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ ශිෂ්‍ය කටයුතු සම්බන්ධීකාරකවරයාය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධරයෙකු වන මෙතුමා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ජීව විද්‍යාව පිළිබඳ උපාධියද, දකුණු කොරියාවේ ටෝච් ට්‍රිනිටි දේවධර්ම උපාධි පාසලෙන් ක්‍රිස්තියානි අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2007) සහ අධ්‍යාපන අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධිය (2020) ද ලබා ඇත. යෞවන කිතුමග සඳහා යෞවන දේවගැතිවරයෙකු සහ සේවකයෙකු ලෙස දේවසේවය ආරම්භ කළ ඔහු, කිතු සෙවණ සේවයේ ගෝලත්ව පුහුණු මධ්‍යස්ථානයේ විදුහල්පති ලෙස සේවය කළේය. වර්තමානයේ, ඔහු ශ්‍රී ලංකාවේ සියලු ජාතීන්ගේ සභාවේ දේවගැතිවරයෙකු ලෙස සහ ශ්‍රී ලංකාවේ යෞවන කිතුමග පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි.



ක්‍රිස්නි එදිරිසිංහ, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සම්බන්ධීකාරක (ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය). කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. ඇය ඉරුදින පාසල් ගුරුවරියක් ලෙස වසර 20 ක් සහ පෙර පාසල් ගුරුවරියක් ලෙස වසර 10 ක් සේවය කර ඇති අතර පසුව ශ්‍රී ලංකා ළමා ධර්මදන සහභාගිත්වයේ (CEF) මොරටු ශාඛාවේ අධ්‍යක්ෂිකාව ලෙසද සේවය කර ඇත. ඇය කම්පනයට පත් දරුවන් සහ යෞවනයන්ගේ හදවත් සුවපත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන පුහුණු පහසුකම් සලසන්නියක වශයෙන් සහ මවකගේ අභිප්‍රාය ජාතික කමිටුවේ සම සම්බන්ධීකාරිනිය හා ප්‍රධාන පුහුණුකාරිනියක් ලෙස ද සේවය කරයි. වර්තමානයේ ඇය අන්තර් නිකායික සාකල්‍ය පවුල් සේවා මෙහෙවරයක මෙන්ම ළමා උපදේශකවරියක් ලෙසද සේවයේ නියැලී සිටී.

කථිකාචාර්යවරුන්ගේ විස්තර



දිලිප් ගුණවීර, BTh, MSW

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උතුරු මැද ප්‍රාදේශීය අධ්‍යයන මධ්‍යස්ථානයේ සම්බන්ධීකාරකවරයාය. කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ සහ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) උපාධිධාරියෙකි. පුරෝගාමී සේවය සහ දේවගැති සේවය පිළිබඳ වසර දහයකට වැඩි පළපුරුද්දක් ඇති ඔහු මොරටුව කල්වාරි දේවස්ථානයේ සිංහල සභාවේ දේවගැතිවරයා ලෙස සේවය කළේය. වර්තමානයේ ඔහු අනුරාධපුර ලංකා දේව සභාවේ ගිහි දේශකයෙකු සහ නායකයෙකු ලෙස ද සේවය කරන්නේය.



ලසිත් රාජකරුණා, BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) බයිබලීය අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. යෞවන කිතුමඟ සංවිධානයේ ස්වේච්ඡා නායකයෙකු ලෙස අවුරුදු 16ක්ද, පූර්ණකාලීන සේවකයෙකු ලෙස අවුරුදු 3ක් ද සේවය කර ඇත. මහනුවර බැප්ටිස්ට් සභාවේ ඩිකන් මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද ක්‍රියා කර ඇත. ඔහු නුගේගොඩ මෙතෝදිස්ත දේවස්ථානයේ නමස්කාර කරයි.



මහින්ද මුණසිංහ, BTh, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියකු වන අතර කැම්පස් කෘසෙඩ් ෆෝර් ක්‍රයිස්ට් සහ නැවිගේටර්ස් ආයතනයන් හි දිගු කලක් සේවය කර ඇත. පිලිපීනයේ ජාත්‍යන්තර නායකත්ව පිළිබඳ විද්‍යාලයේ (IGSL) පරිවර්තනාත්මක නායකත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. මෙතෝදිස්ත සභාවේ ගිහි නායකයෙක් සහ පූර්ණ ගිහි දේශකයෙක් ලෙස සේවය කරන අතර වර්තමානයේ ගෝලයන් ගොඩනැගීමේ සේවාවේ නියුක්තව සිටී.



සරත් ද සිල්වා, BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL–Philippines) ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. වසර 30කට අධික කාලයක් පුරා විවිධ සේවා ක්ෂේත්‍රවල පුළුල් අත්දැකීම් ඇති, වර්තමානයේ ඌව, නැගෙනහිර හා බස්නාහිර යන පළාත්හි බොහෝ පුරෝගාමී සේවකයින්ගේ මිත්‍රෝපදේශයෙකු (Mentor) ලෙස කටයුතු කරයි. තවද පීඩා විඳින සභාවන් වෙනුවෙන් සේවය කරන නිව් හාර්වෙස්ට් ෆවුන්ඩේෂන් ආයතනයේ ජාතික අධ්‍යක්ෂක වශයෙන් ද කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ දේවගැතිවරයෙකි.

කථිකාචාර්යවරුන්ගේ විස්තර



සුරංග අතුකෝරාළ, ADCN, DIM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, හිටපු තොරතුරු තාක්ෂණ කළමනාකරු හා සහකාර පුස්තකාලයාධිපතිවරයාය. ජනතා දේව සභාවේ ප්‍රාදේශීය නායකයෙකු ලෙස සේවය කරන අතර පාලන මණ්ඩලයේ පරිපාලන කමිටුවේ සභාපති ධුරයද දරයි. එලෙසම දේව සභා සංගමයේ (එසෙම්බ්ලි ඔෆ් ගෝඩ්) අක්තපත්‍රධාරියෙක් වන හෙතෙම වර්තමානයේ සිම්පල් මියුසික් හි සාමාන්‍ය අධිකාරී වශයෙන්ද කටයුතු කරන්නේය. කිතු බැති ගී දැහැන සිංහල ගීතිකා කෝඩ් ඇප් හා වෙබ් සේවය මොහුගේ නිර්මාණයි.



බෙනිසි සිල්වා, BTh, MDiv

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ දේවවේදී උපාධියද, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) දේවධර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියද ලබා ඇත. දැනට කිතුනු ධර්මය ඉගැන්වීමේ හා පුහුණුකිරීමේ සේවයේ යෙදී සිටින අතර, අවුරුදු 10ක පමණ තරුණ සේවයේ නායකත්වයද අවුරුදු 24ක පමණ සභාවේ දේවගැති සේවයේද අත්දැකීම් ලද්දෙකි.



ශානක ප්‍රනාන්දු, DipArch, DipEng, BTh, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකු වන අතර, පිලිපීනයේ නායකත්වය පිළිබඳ ජාත්‍යන්තර උපාධි විද්‍යාලයේ (IGSL) ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. ඔහු වසර 13 කට වැඩි කාලයක් වාස්තු විද්‍යාව සහ ඉංජිනේරු විෂයයන් සඳහා කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර තිබේ. වසර 15 කට වැඩි කාලයක් තරුණයන් අතර සේවය කිරීමේ සහ සභා රෝපණය පිළිබඳ පුරෝගාමී අත්දැකීම් ඇත්තෙකි. ජීවමාන ක්‍රිස්තු සභාවේ සහකාර දේවගැතිවරයෙකු ලෙස ඔහු සේවය කරයි.



මනෝජ් පීරිස්, DipHTM, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. මීගමුව ප්‍රදේශයේ පැල්පත්වාසී ජනතාව සමඟ සේවය කරන අතර Friends in Christ ගෝලත්ව සේවයෙහි පුරෝගාමී හා මිත්‍රෝපදේශක ලෙස කටයුතු කරයි. ජීවමාන ක්‍රිස්තු සභාවේ තරුණ සේවය භාර පාලකවරයා වශයෙන් වගකීම් දරයි. සිංගප්පූරුව කවනන්ට් ප්‍රෙස්බිටේරියානු සභාවේ ශ්‍රී ලාංකීය සේවයෙහි ලාංකීය කලාපය භාර සභාපාලකවරයෙක් ලෙස ද කටයුතු කරයි.

කව්කාචාර්යවරුන්ගේ විස්තර



නාමල් වීරසිංහ, HND (Counselling), BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. යෞවන කිතුමග සංවිධානයේ (TFC) වසර 30 ක පූර්ණ කාලීන සේවයේ නියැලි සිටින එතුමන් වර්ථමානයේ පුහුණු අංශය හා තාරුණ්‍යය දිරිගැන්වීමේ සේවාවන් භාරව කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උපදේශනය පිළිබඳව ජාතික ඩිප්ලෝමාව (NDC) උසස් ජාතික ඩිප්ලෝමාව (HND) ලබා ඇත. උපදේශන කටයුතු වල නිරත වන ඔහු ශ්‍රී ලංකා මෙතොදිස්ත සභාවේ ගිහි දේශකයෙකු ලෙස කට යුතු කරයි.



චමිලා සුභාෂ් රණසිංහ, HND (Counselling), BTh, BA, MSoc

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි වන අතර ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ඇත. තවද, ශ්‍රී ලංකා පදනම් ආයතනයෙන් උපදේශනය පිළිබඳ ජාතික උසස් ඩිප්ලෝමාව හදරා ඇත. වසර ගණනාවක් සභාපාලිකාවක ලෙසත්, ජීවිතාලෝක ආයතනයේ සිංහල සේවා කළමනාකාරිනිය ලෙසත් කටයුතු කර ඇති ඇය, කිතුනු මාධ්‍ය ක්ෂේත්‍රයේ මෙන්ම ලේඛන සේවයේ ද නිරත වන්නීය. තවද, ගෝලත්ව සේවයේ මෙන්ම උපදේශන සේවයේ නිරත වන ඇය මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



මධු මිහිරි ප්‍රනාන්දු, Dip MME, BA, MA

කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරිණියකි. වසර විසි දෙකක් කොළඹ බිෂොප් විදුහලේ ගුරුවරියක් ලෙස සේවය කළ අතර උපදේශකවරියක් ලෙසද කටයුතු කරයි. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය නාලිකා හි වැඩසටහන් මෙහෙයවන්නියක් වන අතර කිතුනු ගුරු පුහුණු උපදේශකවරියක් ලෙසද සේවය කරයි. ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශිකාවකි.



ගයත්‍රි ද අල්විස්, BTh, PgDip, MA

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරිණියකි. ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උසස් ජාතික උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාවද ලබා ඇත. කොළඹ විශ්ව විද්‍යාලයෙන් ළමා ආරක්ෂණය සහ අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබා ඇති ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ සුදුසුකම් ලත් උපදේශිකාවක් සහ අභිප්‍රේරණ කථිකයෙකි. නාරාහේන්පිට ජනතා දේව සභාවෙහි සාමාජිකාවකි.

කථිකාචාර්යවරුන්ගේ විස්තර



දුමින්ද වීරසිංහ, BTh

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ උපාධිධාරියෙකි. ඔහු යෞවන කිතුමඟ-ශ්‍රී ලංකා සංවිධානයේ (Youth for Christ - Sri Lanka), බස්නාහිර පළාත් සිංහල සේවයේ ප්‍රධානියා ලෙස සේවය කරනු ලබයි. යෞවන කිතුමඟ සංවිධානය තුළ වසර 17 කට අධික පූර්ණකාලීන සේවා අත්දැකීම් ඔහු සතුය. තවද ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාවේ ගිහි දේශකයෙකු ලෙසද සේවය කරයි. ඔහු තරුණ සේවය සහ බයිබලීය ඉගැන්වීම් යන ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රධාන වශයෙන්ම උනන්දුවක් සහ විශේෂත්වයක් දක්වයි.

CTS පාඨමාලා විස්තර

ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලයේ පාඨමාලා හැදෑරීම සඳහා සාදරයෙන් පිළිගන්නා අතර අධ්‍යයන පාඨමාලා හැදෑරීම සඳහා අප ඔබ දිරිමත් කරන්නේ කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය වෙතින් ඔබට ලබාගත හැකි උපරිමය අත්කරගනු සඳහාය.

කොළඹ දේවධර්ම ශාස්ත්‍රාලය විසින් පෙළ දෙකක අධ්‍යාපනයක් පිරිනමයි. ඒ සියල්ල ම ආසියානික දේවධර්ම සංගමය (ATA) විසින් පිළිගනු ලැබ තිබේ. ඔබට වඩාත් ගැළපෙන්නේ කුමන පාඨමාලාවදැයි කියවා අනාවරණය කරගන්න.

ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය (CCS)
21 වැනි සියවසේ ජීවිතය, රැකියාව හා සේවය වෙනුවෙන් (ගිහි) කිතුනුවන් සවිගැන්වීම පිණිස මෙය සැලසුම්කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
අවශ්‍ය සම්මාන ප්‍රමාණය 36කි

දේවධර්ම ඩිප්ලෝමා (DipTh)
කිතුනු සේවකයන් සඳහා ගැඹුරු බයිබලීය අන්තර් දෘෂ්ටියක් හා සේවය සඳහා නිපුණත්වයක් ලබාදීම සඳහා මෙය සැලසුම්කර ඇත.
ඉගැන්වීම් මාධ්‍ය: සිංහල සහ දෙමළ
අවශ්‍ය සම්මාන ප්‍රමාණය 72කි

වැඩි විස්තර/ සහය සඳහා විමසන්න:
අධ්‍යයන කාර්යාලය
011 2890809; extensions@cts.lk

ක්‍රිස්තියානි අධ්‍යාපන සහතිකය
ළමා සේවා ක්ෂේත්‍රය

පාඨමාලාව:

- පාඨමාලාවක් සාමාන්‍යයෙන් සතියකට දෙවරක් පැය 3ක කාලයක් පැවැත්වේ.
  - සෑම සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනකම ප.ව.6:00-9:00 දක්වා
- සෑම විෂයක් සඳහා සම්මාන පැය දෙකකි.
- වසර 2කින් ශිෂ්‍යයා හට මෙම විෂයමාලාව නිමකළ හැකිවන අයුරින් සැලසුම් කර ඇත.

	විෂයන්	සම්මාන
අනිවාර්ය		
බයිබලය සහ දේවධර්ම විෂයන්	04	08
ළමා සේවා විෂයන්	04	08
වෛකල්පික විෂයන්	10	20
සම්මන්ත්‍රණ	04	00
එකතුව	22	36

සැ.යු.: සහතික පත්‍රය ලබාගැනීමට ඉහත සියලු විෂයන් සම්පූර්ණ කළ යුතු වේ.

පාඨමාලා දේශන පැවැත්වීම:

- **අන්තර්ජාලය හරහා:** පාඨමාලාව Zoom තාක්ෂණය හරහා ඉගැන්වෙන අතර අදාළ සටහන් Moodle පහසුකම තුළින් ලබා ගත හැකිය. ඔබට වේගවත් අන්තර්ජාල සම්බන්ධතාවක් හා ඩිජිටල් උපාංගයක් අවශ්‍ය වනු ඇත.

සන්නිවේදන තොරතුරු:

ක්‍රිස්නි එදිරිසිංහ මිය
සම්බන්ධීකාරක: ළමා සේවා ක්ෂේත්‍රය
දුරකථන අංකය: +94 764823127
විද්‍යුත් තැපෑල්: cm@cts.lk

කිතු සම්ඳාණන් තුළ සබැඳි ජීවිතය



189 දුටුගැමුණු විදිය, කොහුවල
(+94) 11 2890809 | student.services@cts.lk | www.cts.lk